'ජපානය මෙතරම් පිරිසිදු රටක් බවට පත් වූයේ බුදුදහමේ බලපෑම නිසාද?' යන මැයෙන් යුතුව ස්ටීව් ජෝන් පවල් සහ ඇන්හෙලස් මරීන් කැබැල්ලෝ විසින් රචිත ලිපියක් BBC පුවත් සේවයේ පළ වූ අතර, එම ලිපියේ සිංහල පරිවර්තනය BBC සිංහල අඩවියේ 2013 දෙසැම්බර් 03 දින පළ කෙරී තිබිණි. ඉන් පසුව 2019 දෙසැම්බර් 06 දින දිවයින ඔන්ලයින් සංස්කරණයේද 'ජපානය මෙතරම් පිරිසිදු රටක් බවට පත් වූයේ බුදුදහම නිසා!' යන මැයෙන් යුතුව, කීර්ති වර්ණකුලසූරිය විසින් සංස්කරණිත ලිපියක් පළ වෙයි. BBC ලිපියේ හෙඩිමේ වන ප්‍රශ්නාර්ථ සළකුණ දිවයින ඔන්ලයින් ලිපියේ විශ්මයාර්ථ සලකුණක් බවට පත් වීම හැරෙන්නට, BBC ලිපියෙන් 65% කට වැඩි ප්‍රමාණයක් වන දිවයින සම්පූර්ණ ලිපියම එම BBC ලිපියෙන් උපුටා ගත් කොටසක් වෙයි. එසේම BBC ලිපියෙහි ඡායාරූපයක්ම දිවයින ඔන්ලයින් මගින්ද භාවිතා කොට ඇත. එය එසේ වුවත් කොතැනක හෝ මේ සියල්ල BBC වෙතින් උපුටා ගත් බවක් සඳහන් කොට හෝ, එහි මුල් රචකයින් සම්බන්ධයෙන් සඳහන් කිරීමක් හෝ දක්නට නැත!

රචනා චෞරත්වය ලෙසින් හැඳින්වෙන්නේ වෙනත් පාර්ශවයක් විසින් රචනා කරනු ලැබූ, නිර්මාණය කරනු ලැබූ යමක් එහි මුල් අයිතිය හිමි පාර්ශවය නැතිනම් මූලාශ්‍රය සම්බන්ධයෙන් කිසිදු සඳහනකින් තොරව වෙනත් පාර්ශවයක් මගින් පළ කිරීමයි. මෙම ලිපියේ අන්තර්ගතය ලබාගැනීම සඳහා BBC වෙතින් හෝ එම ලිපියේ මුල් රචකයින් වෙතින් අවසරයක් ලබාගෙන තිබේද? එසේ නම් එම පාර්ශවයන් සම්බන්ධයෙන් මෙහි සඳහන් නොවන්නේ මන්ද? අපට නැගීමට ඇති පැනයන් මේවායි. එසේම මුල් ලිපිය සංස්කරණය කොට නැවත දිවයින ඔන්ලයින් හි පළ කළ බවක් හැඟී යන පරිද්දෙන් සංස්කරණය කළ මාධ්‍යවේදියාගේ නම මෙහි පළ වුවත්, සම්පූර්ණ ලිපියෙන් කොටසක් කපා හැරීම සහ ප්‍රශ්නාර්ථය විශ්මයාර්ථය කිරීම හැර වෙනත් කිසිදු සංස්කරණයක් මෙහි සිදුවී නොමැති බැවින්ද, එම වරද සංස්කරණිත බව සඳහන් කිරීමෙන් නිවැරදි නොවේ. කෙටියෙන් පවසන්නේ නම් මෙය දැඩි ජනමාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේද? #mediaethics #SinhalaPress #Divaina #BBC News සිංහල #lka

BBC මුල් ඉංග්‍රීසි ලිපිය: http://www.bbc.com/travel/story/20191006-what-japan-can-teach-us-about-cleanliness

BBC මුල් සිංහල පරිවර්තනය: https://www.bbc.com/sinhala/world-50585189

දිවයින ඔන්ලයින් ලිපිය: http://www.divaina.com/daily/index.php/vides-3/36481-2019-12-05-11-54-48